# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1867/4 – 2014 ජුනි 16 වැනි සඳුදා – 2014.06.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, මහකළුගොල්ල පොලිස් මුරපොල පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගම (කැ.සි. 720002, කලාප අංක 4) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ඕ/එස්වයිබී/2012/320 හා 2012.12.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 1.6378 ක් පමණ වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – බුරුතගහ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0461**
උතුරට: මාර්ගය සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය.

02. **කැබලි අක්ෂර 'බී' – බුරුතගහ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.5225**
උතුරට: කැබලි අක්ෂර සී; නැගෙනහිරට: කැබලි අක්ෂර සී සහ කැ.සි. 720002 හි කලාප අංක 4 හි කැබලි අංක 328; දකුණට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ.

03. **කැබලි අක්ෂර 'සී' – බුරුතගහ වත්ත – ප්‍රමාණය: හෙක්. 1.0692**
උතුරට සහ නැගෙනහිරට: කැ.සි. 720002 හි කලාප අංක 4 හි කැබලි අංක 328; දකුණට සහ බටහිරට: කැබලි අක්ෂර බී, ඒ, මාර්ගය, කැ.සි. 720002 හි කලාප අංක 4 හි කැබලි අංක 336 සහ 328.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/4/2010/ඩී/303.
2013 දෙසැම්බර් මස 24 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 12


1A – G19729 – 10 (2014/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*